www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# බීබීසි මත විමසුම ධනවාදයට එරෙහිව පුලුල්ව පැතුරුනු අතෘප්තිය පෙන්නුම් කරයි

## BBC poll shows widespread disaffection with capitalism

ජුලී හයිලන්ඩ් විසිනි.
2009 නොවැම්බර් 12

බ්‍රිතාන්‍ය ගුවන් විදුලියේ ලෝක සේවය මගින් ලොවපුරා සිදුකල ජන මත සමීක්ෂනය මගින් ධනවාදී නිදහස් වෙලඳපල කෙරෙහි පුලුල්ව පැතුරුනු අකමැත්තක් පෙන්නුම් කරන අතර මෙය ධනවාදය කෙරෙහි වූ සැලකිය යුතු විරෝධය පල කිරීමකි.

ග්ලෝබල් ස්කෑන් සහ පීඅයිපීඒ විසින් ජුනි 19 සිට ඔක්තෝබර් 13 දක්වා සිදු කරන ලද මත විමසුමේ දී රටවල් 27 ක පුද්ගලයින් 29,000 කගෙන් කරුනු විමසා තිබුනි. ඔවුහු එක්සත් ජනපදය, කැනඩාව, මෙක්සිකෝව, බ්‍රසීලය, පැනමාව, කොස්ටාරිකාව, පිලිපීනය, ඉන්දියාව, පාකිස්ථානය, චීනය, රුසියාව, යුක්රේනය, තුර්කිය, ඉතාලිය, එක්සත් රාජධානිය, ස්පාඤ්ඤය, නයිජීරියාව, ඊජිප්තුව හා කෙන්යාවේ වාසය කරති.

සෑම පස්දෙනෙකුගෙන් තුන්දෙනෙකුට වැඩි ප්‍රමානයක් නිදහස් වෙලඳපල ධනවාදයට විරුද්ධ බව මත විමසුම මගින් සොයා ගන්නා ලදී. සියයට 89 කට වැඩි ප්‍රමානයක් විශ්වාස කලේ ධනවාදය නිසි ලෙස ක්‍රියාත්මක නොවන බවය. කරුනු විමසූ රටවල් 22 ක පුද්ගලයින්ගෙන් බහුතරයක්, සමාජීය වශයෙන් සාධාරන ලෙස ධනය බෙදීයන පරිදි ව්‍යාපාර හා වෙලඳපල දැඩි නියාමනයකට යටත් කිරීමටත්, ආන්ඩුවේ පුලුල් මැදිහත් වීමක් සඳහාත් දැඩි ලෙස සිය සහයෝගය පල කලහ.

හතරෙන් එකක් පමන ධනවාදය "වෙනස් ක්‍රමයක්" මගින් විස්ථාපනය කල යුතු බව විශ්වාස කලහ.

"මත විමසුමෙන් මතුව ආ පරිදි, ගෝලීය එකඟතාවයක් පලවූ එක් කාරනයක් වූයේ, සෑම තැනකම පාහේ බහුතරයකට අවශ්‍ය වී ඇත්තේ ආන්ඩුව වඩාත් සක්‍රීයව ව්‍යාපාර නියාමනය කිරීම" බව බීබීසි වාර්තා කලේ ය.

පාකිස්ථානය හා ඇමරිකාව යන දෙරටෙහි පමනක්, සෑම පුද්ගලයන් පස් දෙනෙකුගෙන් එක් අයෙකුට වැඩි ගනනක් විශ්වාස කරන්නේ පවතින ආර්ථික ක්‍රමය හොඳින් ක්‍රියාත්මක වන බවයි. රටවල් 27 න් 22 කම බහුතරය එනම් සියයට 67 ක සාමාන්‍යයක් නැත්නම් සෑම 3 දෙනෙකුගෙන් දෙදෙනෙක්ම පුලුල් ලෙස ධනය බෙදාහැරීමට පක්ෂ වූහ. ඒ අතරින් රටවල් 17 කම බහුතරයක් අදහස් කලේ, විශාල ව්‍යාපාර සඳහා දැඩි නියාමනයක් අවශ්‍ය වන බවයි. ඒ අතරින් විශේෂයෙන්ම රුසියාව, යුක්රේනය, බ්‍රසීලය, ඉන්දුනීසියාව හා ප්‍රන්සය ඇතුලු රටවල් 15 ක බහුතරය, විශාල ව්‍යාපාරවල අයිතිය හෝ පාලනය සම්බන්ධයෙන් තවදුරටත් ආන්ඩුවේ ක්‍රියාකාරී මැදිහත්වීම පිලිබඳව කැමැත්තක් දැක්වී ය.

සියයට විසි තුනක් ධනවාදය "මාරාන්තික ලෙස අසාර්ථකවී" ඇති බවට විශ්වාසය පල කලහ. මත විමසුමට බඳුන්වූ ඊට සමාන ප්‍රන්ස වැසියන් සංඛ්‍යාවකගෙන් සියයට 43 ක් ධනවාදය අසමත් වී ඇතැයි නිගමනය කරති. සියයට 47 කගේ ප්‍රතිචාරය වූයේ, එහි ඇති අඩුපාඩුකම් දැඩි නියාමනයකින් හා ප්‍රතිසංස්කරන මගින් විසඳාලිය හැකි බවයි. ප්‍රන්සය ලඟට වැඩිම පිරිසක් ධනවාදය විස්තාපනය කල යුතුය යන අදහසට සහය පල කලේ මෙක්සිකෝවේය. එහි සියයට 38 ක් හා බ්‍රසීලයේ සියයට 35 කි. බීබීසී වෙබ් අඩවිය විශේෂයෙන් සඳහන් කල රටවල් 12 ම සියයට 10 කට වැඩි පිරිසක් මේ මතයට සහයෝගය දැක්වූහ. මේ සෑම අවස්ථාවක ම වර්තමානයේ පවතින ක්‍රමයට සහය පල කලේ සුලුතරයයි.

මත විමසුම සංඛ්‍යාත්මක විෂමතා කිහිපයක් ඉතිරි කර ඇත. උදාහරනයක් වශයෙන් සංගනනයට සහභාගී වූ ඇමරිකානු වැසියන්ට වඩා අඩු ජර්මන් වැසියන් සංඛ්‍යාවක් ධනවාදය අසමත් වී ඇතැයි යන මතයට සහාය පල කලහ. එසේ වුවත් ඒ සෑම අවස්ථාවක ම බහුතරය, එනම්, ඇමරිකාවේ සියයට 70 ක් හා ජර්මනියේ සියයට 80 ක්, දැනට පවතින තත්වය පිලිබඳව ඔවුන්ගේ නොැකමැත්ත පල කලහ.

"සෝවියට් සංගමය විසුරුවා හැරීම "හොඳ දෙයක් ද" යන්නට ලැබුන ප්‍රතිචාරය බලාපොරොත්තු නොවුවක් නොවේ. ඇමරිකාව, කැනඩාව, බටහිර හා මධ්‍යම යුරෝපය හා ඕස්ට්‍රේලියාවේ බහුතරය, එනම්, සියයට 73 ක් හා සියයට 81 ක් ඊට පක්ෂව ප්‍රතිචාර දැක්වීය. සෝවියට් සංගමය විසුරුවා හැරීම තම ජීවන තත්වයන් හා ලැබුනු ආර්ථික සහ දේශපාලනික

අනුග්‍රහය නැතිවී යාම මත ඍජු ලෙස බලපෑ රටවල දී හෝ එය ධනවාදයට විකල්පයක් ලෙස පුලුල්ව දැකගනු ලැබුනු රටවල දී තත්වය එහි ප්‍රති විරුද්ධයයි. ඊජිප්තුවේ හා පකිස්ථානයේ බහුතරයකට වගේම සියයට 61 රුසියානුවන් හා සියයට 54 යුක්රේන් ජාතිකයන් ට එහි රිනාත්මක බලපෑම දැනුනි. බීබීසී අනුව, "සෑම ඊජිප්තු ජාතිකයන් 10 දෙනෙකුගෙන් 7 කටම සෝවියට් සංගමයේ අවසානය නරක දෙයක් විය. ඉන්දියාව කෙන්යාව හා ඉන්දුනීසියාව වැනි රටවල එහි බලපෑම පිලිබඳව තියුනු ලෙස බෙදී ගිය මතයක් ප්‍රකාශ විය."

සමස්තයක් ලෙස, සමීක්ෂනයට සහභාගී වු රටවල් 15 න් සියයට 54 ක් වූ තුනි බහුතරයක් සෝවියට් සංගමය විසුරුවා හැරීම ධනාත්මක බව කියා සිටි අතර සියයට 24 ක් කීවේ ඒ පිලිබඳව ඔවුන්ට අදහසක් නැති බවයි.

සමීක්ෂනය, බර්ලින් තාප්පය බිඳවැටී වසර 20 ක් ගත වීම සැමරීම සඳහා සංවිධානය කල උත්සව හා සමපාත වන ලෙස පවත්වා තිබුනි. මිහායල් ගොර්බචොව් හා බොරිස් යෙල්ට්සින් යටතේ නැගී එමින් සිටි ධනපති පන්තියක් සේ ස්ටැලින්වාදී නිලධාරී තන්ත්‍රය විසින්, නැගෙනහිර යුරෝපයේ සහ සෝවියට් සංගමයේ පැවති ජනසතු දේපල පෙරලා දමනු ලැබිනි.

බීබීසි සඳහන් කලේ, 1989 දී නිදහස් වෙලඳපල ධනවාදය සීතල යුද්ධය අවධියේ දී ජයග්‍රාහි ලෙස නැගී සිටි බවයි. එහෙත් දැන් ග්ලෝබ්ස්කෑන් සභාපති ඩග් මිලර් ප්‍රකාශ කරන්නේ "විශේෂයෙන් ම පසුගිය මාස 12 සිදු වු සිද්ධි හා සලකා බලන විට 1989 දී බර්ලින් තාප්පය බිඳ වැටීම එය එකල දුටු ආකාරයට ධනවාදී නිදහස් වෙලඳපල ක්‍රමය අත්කර ගත් දැවැන්ත ජයග්‍රහනයක් නොවේ."

ඉන් අදහස් වන්නේ, ලොව පුරා ආර්ථිකයන් කඩා බිඳ දමමින් ද ජීවන තත්වයන් විනාශ කරමින් ද වර්ධනය වූ ආර්ථික අර්බුදයයි.

බලවත් රාජ්‍යයන්ගේ නායකයෝ "නිදහසේ මහෝත්සවය" ලෙස නම්කර තිබූ, බර්ලින් තාප්පය කඩාවැටීම සැමරීම සඳහා පසුගිය නොවැම්බර් 09 බර්ලිනයට රැස්වූයේ මේ තත්වයන් යටතේ ය. එහෙත් ස්ටැලින්වාදී පාලන තන්ත්‍රයන් පෙරලා දැමීමේ ජනතා උද්යෝගය නැවත ඇති කිරීමට ගත් උත්සාහයන් ජයග්‍රහකයා යයි සිතන ලද ධනපති ක්‍රමය තුලම පැනනැගී ඇති ගැඹුරු අර්බුදය නිසා අසාර්ථක විය.

ගෝලීය ධනවාදයේ කඩාවැටීමෙහි හරිමැද ඇත්තේ ඇමරිකාවයි. සෝවියට් සංගමය හා නැගෙනහිර යුරෝපයේ සිදුවු පෙරලි වලින් අනතුරුව සිය ජයග්‍රහනය ප්‍රකාශයට පත්කල ඇමරිකාව, අද ආර්ථික වශයෙන් බංකොලොත් වී ඇත.

යථාර්ථය නම්, ලියොන් ට්‍රොට්ස්කි අනතුරු අඟවා තිබු පරිදි "සෝවියට් සංගමය හා එහි පරිවාර රාජ්‍යයන් විසුරුවා හැරීම වනාහි, ස්ටැලින්වාදී නිලධාරී තන්ත්‍රය විසින් සිදුකරන ලද ප්‍රතිගාමී ක්‍රියාකලාපයේ සහ එහි ප්‍රතිපත්තිය වු තනි රටේ සමාජවාදය ගොඩනැගීමේ ඛේදජනක හා අනිවාර්ය ප්‍රතිපලය විය."

නොවැම්බර් 09 වන දා *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* අවධාරනය කල ආකාරයට, "ලෝක ආර්ථිකය හා ජාතික රාජ්‍යයන් අතර ඇති පරස්පර විරෝධයන් - ලෝකය පුරා කම්කරුවන් එකාබද්ධ සමාජීය නිෂ්පාදන ක්‍රියාවලියකට එකට එකතුකල නිෂ්පාදනයේ භූගෝලීය ස්වභාවය සහ ලෝකය එකිනෙකට ප්‍රතිවිරුද්ධ ජාතික රාජ්‍යන්ට බෙදී තිබීම - දශක දෙකකට පෙර ස්ටැලින්වාදී රාජ්‍යයන්ගේ පිටකොන්ද බිඳ දැමී ය. කෙසේ වෙතත්, මෙම පරස්පරවිරෝධයන් පිටුපස, අධිරාජ්‍යවාදී බලයන් අතර වර්ධනය වන ගැටුම්, උග්‍ර වන ඉරාක හා ඇෆ්ගනිස්ථාන යුද්ධ, කම්කරුවන් දිනාගත් සමාජයීය අයිතීන් වලට එල්ල කරන නොනවතින ප්‍රහාර ලෙස හා ධන කුවේරයන්ගේ උඩඟුකම සහ කෑදරකම ද එලෙෂ ම පවතී."

මෙම වසර අවසාන වන විට බිලියනයකට අධික ජනතාවක් මන්දපෝෂනයෙන් පෙලෙන තත්වයකට මුහුන දෙනු ඇති බවට එක්සත් ජාතීන්ගේ ආහාර සංවිධානය පසුගිය මාසයේ වාර්තා කලේ ය. ඊට අමතරව, මිලියන සියයක් ජනතාව - මෙය ලෝක ජනගහනයෙන් හයෙන් එකකි - ලෝක ආර්ථික පසුබෑමේ ඍජු ප්‍රතිපලය ලෙස මේ වන විට මන්දපෝෂන තත්වයකට මුහුනපා සිටිති. මේ වැඩිවීම බොහෝ කොටම සිදු වී ඇත්තේ ආසියාව, අප්‍රිකාව, කැරිබියන් සහ මැදපෙරදිග වැනි ලෝකයේ දුප්පත්කම වැඩිම ප්‍රදේශවල ය.

පැරනි සෝවියට් සංගමයේ සහ නැගෙනහිර යුරෝපයේ රටවල ජීවන තත්වයන්ගේ විනාශකාරී කඩාවැටීම් පිලිබඳවත් ඔක්තෝබර් මාසයේ දී ලෝක බැංකුව වාර්තා කලේ ය. "නැගී එන යුරෝපීය සහ මධ්‍යම ආසියාවේ" මෙම වසරේ ආර්ථික වර්ධනය සියයට 5.6 කින් වැටෙන බවට අනාවැකි පල කරන ලෝක බැංකු වාර්තාව, මේ ප්‍රදේශයේ විරැකියාව මිලියන 11.4 ක් බව ද සඳහන් කලේ ය. කලාපයේ ජනගහනයෙන් තුනෙන් එකක් දරිද්‍රතාවයෙන් පෙලෙති.

ධනපති ජයග්‍රහනවාදය සඳහා පසුබිම වු බටහිර යුරෝපයේ තත්වය ඊට වඩා හොඳ නොවේ. ගෝලීය අර්බූදය හේතුවෙන් 2014 වන විට එහි සාමාජික රාජ්‍යයන්ගේ සමස්ත නය ප්‍රමානය දල ජාතික නිෂ්පාදිතයෙන් සියයට 100 ක් දක්වා ඉහල යා හැකි බවට යුරෝපා සංගමය අනතුරු අගවා තිබේ. "මූල්‍ය විනය" ඇතිකල යුතු බවට කැඳවුම් කරමින් එය, විශේෂයෙන් රටවල් පහක් බංකොලොත් වීමේ හැකියාව සහිතව අවදානම් තත්වයේ පසුවෙන බව අවධාරනය කලාය. ලෝකයේ හයවන හා යුරෝපයේ තුන්වන ලොකුම ආර්ථිකය වන එක්සත් රාජධානිය ද මෙම

රටවල් පහට අයත් ය. බ්‍රිතාන්‍ය ආන්ඩුව රාජකීය ස්කොට්ලන්ත බැංකුව බංකොලොත් වීමෙන් වලක්වා ලීම සඳහා ආධාර සහ උත්තේජක පැකේජ වශයෙන් තනි බැංකුවක් සඳහා වු ලෝකයේ විශාලතම මූල්‍යමය ඇප දී ම නිවේදනය කල අතර, පොදු අරමුදල් වලින් බැංකු වලට ලබාදී ඇති ආධාර හා උත්තේජක පැකේජ වල වටිනාකම දැන් පවුම් ට්‍රිලියනයක් දක්වා ඉහල නැග තිබේ.

එක්සත් ජනපදයේදී බැරක් ඔබාමාගේ පත්වීම, පෙර පැවති බුෂ්ගේ දක්ෂිනාංශික මහා ව්‍යාපාරික ගැති ප්‍රතිපත්තිවල දුර්වල වීමක් සනිටුහන් නොකලා ය. ඔහුගේ පාලනය යටතේ ඩොලර් බිලියන 700 ක් බැංකුවලට ලබා දී ඇති අතර, නය සහනාධාර සහ අනෙකුත් සහතිකවීම් වශයෙන් තවත් ඩොලර් ට්‍රිලියන 23.7 ක් වෝල් වීදියේ මූල්‍ය පරපෝෂිතයන් වෙත පිරිනමා ඇත. දැන් පකිස්ථානය තුලට ම ගෙන ගොස් ඇති යුද ආක්‍රමනය ද ඉරාක හා ඇෆ්ගනිස්ථාන යුද්ධ ද, මෝටර් රථ කර්මාන්තය බංකොලොත්කමට ඇද දමමින් එහි වැටුප් කප්පාදුවට බලකෙරුනු කොන්දේසි යටතේ සුපිරි ධනපතියන්ට ප්‍රධානය කරන ලද මෙම මුල්‍යාධාර ඇමරිකානු කම්කරු පන්තියෙන් උදුරා ගනිමින් පවතී.

ලොව පුරා කම්කරුවන් සිය එදිනෙදා ජීවිතයේදී මුහුන දී සිටින යථාර්තයන්, සමාජ විඥානය මත ඇතිකරන ප්‍රතිවිපාක බීබීසි මත විමසුම තුල අවධාරනය කෙරෙයි. ධනවාදයේ බලය පිලිබඳ මුකරි කතා කුමක් වුවත්, එහිම ක්‍රියාවන් මගින් ධනවාදය අපකීර්තියට පත් වෙමින් තිබේ.

ඒ අතර වාරයේ ම, නිල දේශපාලන නාලිකා (පක්ෂ) තුලින් ප්‍රකාශනයක් අත්කර ගත නොහැකි, වාම නැඹුරුවක් සහිත මනෝගතීන් බීබීසි මත විමසුමෙන් හඳුනාගෙන ඇත. මෙම මත විමසුම සුපුරුදු ප්‍රධාන ප්‍රවාහයේ මාධ්‍යවල කිසිදු ආවරනයක් නොලද්දේ ය යන්න සැලකිය යුතු කාරනයකි.

මෙම මත විමසුමේ ප්‍රතිපල වලින්, වඩාත් පුලුල් දේශපාලන කම්පනයන් හා කැලඹීම් සහිත ක්‍රියාවලියක ආරම්භය සනිටුහන් කරන බව ද අවධාරනය කල යුතු වේ. එලඹෙන කාලපරිච්ඡේදයේ දී ධනවාදයට එරෙහි විකල්පයක් සඳහා හැරීගැනීම - පුද්ගලික ලාභය නොව සමාජ අවශ්‍යතා තෘප්ත කරන, සමාජය සමාජවාදී ආකාරයට ප්‍රතිසංවිධානය කිරීම මගින් - පලල් මහජනයා අතර සවිඥානික දේශපාලන දිශානතිය වනු ඇත.

□ □□□.□□□□.□□□